සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

1වනඅධියර, 4වන මහල ,සෙත්සිරිපාය ,බත්තරමුල්ල.
1ம் கட்டம்,4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1stStage , 4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය
எனதுஇல
My No
DDD/HO/07/SD/16/ENV

ඔබේ අංකය
உமது இல
Your No

දිනය
திகதி
Date
2017.01.04

**දිවිනැගුම ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- දි.ප්‍ර.බැ. 2016/11**

**සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන්,**

## 2015 දෙසැම්බර් 31 දිනට පැවැති වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ප්‍රයෝජනයට ගත නොහැකි කාර්යාල උපකරණ අපහරණය කිරීම හා ක්ෂය උපයෝජනය කිරීම.

දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති සතු කාර්යාල උපකරණ හා අනෙකුත් උපකරණ පහත සඳහන් මූලාශ්‍ර වලින් ලබා ගෙන ඇත.

1. දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති විසින් ඔවුන්ගේ මුදල් යොදවා මිලදී ගත් කාර්යාල උපකරණ.
2. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මඟින් මිලදී ගෙන එම ආයතනය වෙත ලබාදුන් කාර්යාල උපකරණ.
3. බාහිර පුද්ගලයන්ගෙන් හා ආයතනවලින් පරිත්‍යාග ලෙස ලද කාර්යාල උපකරණ.

මෙම කාර්යාල උපකරණ දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති මඟින් ප්‍රයෝජනයට ගැනීමත් සමඟ කිසියම් කාල පරාසයක් තුල ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්වනු ඇත.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් මු.රෙ.756 උපදෙස් ප්‍රකාරව සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට සිදු කරනු වාර්ෂික ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලදී ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස හඳුනා ගන්නා ලද උපකරණ, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලවල උපදෙස් හා මඟපෙන්වීම යටතේ වෙන්දේසි කිරීම හෝ විනාශ කිරීම සිදු කරනු ඇත.

එසේ වෙන්දේසි කරන ලද හෝ විනාශ කරන ලද කාර්යාල උපකරණ ඉන්වෙන්ට්‍රි ලේඛන වලින් හා ගිණුම් පොත්වලින් ඉවත් කල යුතුය.

1. ඉන්වෙන්ට්‍රි ලේඛන වලින් ඉවත් කිරීම.

   ඉන්වෙන්ට්‍රි ලේඛනය ලැබීම් ලෙස ඇති කාර්යාල උපකරණ ඉන්වෙන්ට්‍රි ලේඛන බැහැර කිරීමේ දී අදාල උපකරණ ඉවත් කිරීමේ තීරුවෙන් සටහන් තබා ඉවත් කිරීම සඳහා ලද අධිකාරි බලය සඳහන් කරමින් අඩු කිරීම් කල යුතුය.

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂජනරාල්<br>மேலதிகபணிப்பாளர்தலைமையதிபதி<br>Additional DirectorGeneral | අධ්‍යක්ෂ(පාලන)<br>பணிப்பாளர்(நிர்வாகம்)<br>Director (Administration) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|
| Tel- | 2-011873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 2-011889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

දැනට පොදු ලෙජරයේ ගිණුම් විවෘත වී නොමැති නම් දිවිනැගුම ප්‍රජාමූල බැංකු පොදු ලෙජර් කේත අංක 3317 හා ප්‍රජාමූල බැංකු සමිතිය පොදු ලෙජරය කේත අංක 7409 වශයෙන් අළුතින් උපකරණ ඉවත් කිරීම් ගිණුමක් හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු පොදු ලෙජර් කේත අංක 4046 හා ප්‍රජාමූල බැංකු සමිතිය පොදු ලෙජරය කේත අංක 9410 වශයෙන් අළුතින් වත්කම් ප්‍රතිසම්පාදන සංචිත ගිණුමක් ආරම්භ කර පවත්වා ගත යුතුය.

1. **අපහරණය කළ යුතු කාර්යාල උපකරණ ඉවත් කිරීම සඳහා ගිණුම් තැබීම.**

1.1. අපහරණය කරන ලද (ඉවත් කිරීමට තීරණය කළ) කාර්යාල උපකරණවල ගත් මිල, උපකරණ ගිණුමෙන් ඉවත් කිරීම, (උපකරණ ලේඛනයේ සඳහන් මිල)

හර - උපකරණ ඉවත් කිරීමේ ගිණුම

බැර - උපකරණ ගිණුම

දිවිනැගුම ප්‍රජාමූල බැංකු පොදු ලෙජරයේ කේත අංක 3317 හා ප්‍රජාමූල බැංකු සමිති පොදු ලෙජරයේ කේත අංක 7409 වශයෙන් අළුතින් “උපකරණ ඉවත් කිරීමේ ගිණුම“ ආරම්භ කර පවත්වාගෙන යා යුතුය.

1.2. ඉහත අංක 2 හා 3 යටතේ (ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මඟින් මිලදී ගෙන ලබාදුන් උපකරණ හා බාහිර පුද්ගල හෝ ආයතන වෙතින් පරිත්‍යාග ලෙස) ලද උපකරණ ඉවත් කරන අවස්ථාවේ පහත සඳහන් පරිදි ගිණුම් සටහන් තැබිය යුතුය.

හර - ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මඟින් ලබාදුන් උපකරණ/ පරිත්‍යාග ගිණුම

බැර - උපකරණ ඉවත් කිරීමේ ගිණුම

1.3. අපහරණය කරන කාර්යාල උපකරණවලට අදාලව මෙතෙක් වෙන් කරන ලද ක්ෂය සංචිත ප්‍රමාණයන්,

හර - ක්ෂය සංචිත වෙන් කිරීමේ ගිණුම

බැර - උපකරණ ඉවත් කිරීමේ ගිණුම

1.4. මෙම උපකරණ ඉවත් කිරීම සඳහා වැය කරන වියදම් උදාහරණ :- ප්‍රවාහන ගාස්තු, කම්කරු ගාස්තු

හර - උපකරණ ඉවත් කිරීමේ ගිණුම

බැර - මුදල් ගිණුම

1.5. අපහරණය කරන කාර්යාල උපකරණ, විකිණීමෙන් ලබන මුදල,

හර - ජංගම ගිණුම/ මුදල් ගිණුම

බැර - උපකරණ ඉවත් කිරීමේ ගිණුම

2. **මුදල් ආපසු එවීම.**

3. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියෙන් ලද උපකරණ ඉවත් කරන අවස්ථාවේ විකිණීමෙන් ලද මුදල දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය (මුදල් අංශය) වෙතට ලබාදිය යුතුය. එකී අවස්ථාවේ පහත පරිදි එම ගැලපීම කල යුතුය.

හර - උපකරණ ඉවත් කිරීමේ ගිණුම

බැර - මුදල් හෝ ජංගම ගිණුම

**4. උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභය/ අලාභය**

දිවිනැගුම ප්‍රජාමූල බැංකු පොදු ලෙජර් කේත අංක 4046 හා ප්‍රජාමූල බැංකු සමිතිය පොදු ලෙජරය කේත අංක 9410 වශයෙන් අළුතින් වත්කම් ප්‍රතිසම්පාදන සංචිත ගිණුමක් ආරම්භ කර පවත්වා ගත යුතුය.

3.1. ලාභයක් ඇති විටක, (උපකරණ ඉවත් කිරීමේ ගිණුමේ බැර ශේෂයක් පවතින්නේ නම්),

හර - උපකරණ ඉවත් කිරීමේ ගිණුම

බැර - වත්කම් ප්‍රතිසම්පාදන සංචිත ගිණුම

3.2. අලාභයක් ඇති විටක, (උපකරණ ඉවත් කිරීමේ ගිණුමේ හර ශේෂයක් පවතින්නේ නම්),

හර - වත්කම් ප්‍රතිසම්පාදන සංචිත ගිණුම

බැර - උපකරණ ඉවත් කිරීමේ ගිණුම

කේ.කේ.එල්.චන්ද්‍රතිලක
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)

නීල් හපුහින්න
අධ්‍යක්ෂ ජනරාල්